# 18 ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද

ලොව සැම රටක ම ජීවත් වන කතෝලිකයෝ ශුද්ධ වූ සභාවේ සාමාජිකයෝ වෙති. ඔවුන් දේව වචනය තුළ නිවැරදි මගකට යොමු කිරීම ශුද්ධ වූ සභා නායකයන්ගේ වගකීමකි. දස පනතට අමතර ව ඔවුන් ව නිවැරදි මගට යොමු කිරීම සඳහා ශු. සභාව විසින් සකස් කළ නීති පද්ධතිය, ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද (පනත්) ලෙස සලකනු ලබයි. එම ශික්ෂාපද ගණන පහක් වන අතර ඒවා මෙසේ ය.

1. ඉරුදිනත් ණය මංගල්‍යය දිනත් මුළු පූජා යාගයට සහභාගි වීම
2. වසරකට වරක්වත් පාපෝච්චාරණය කිරීම
3. පාස්කු සමය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම
4. නියම වූ දිනයන්හි ගොඩමස් වැළකීම සහ එක්වරු ශීලය රැකීම
5. සභාවේ නඩත්තුව සඳහා ආධාර කිරීම.

## 1. ඉරු දිනත් ණය මංගල්‍යය දිනත් මුළු පූජා යාගයට සහභාගී වීම

දේව ජනතාවක් වශයෙන් දෙවියන් වහන්සේට අප පුදන යාගය දිව්‍ය පූජාව යි. ඉරුදිනයන්හි සහ ණය මංගල්‍ය දිනයන්හි දිව්‍ය පූජාවට සහභාගි වීම දේව ජනතාවගේ ණය යුක්තියකි. මෙම ණය යුක්තිය සම්පූර්ණ වීමට නම් මුළු දිව්‍ය පූජාවට සහභාගි වීම අත්‍යවශ්‍ය වන්නේ ය. එනම්, ඇතුළුවීමේ ගිතිකාවේ සිට දිව්‍ය පූජාව අවසානයේ ගැයෙන ගීතිකාව දක්වා ම දිව්‍ය පූජාවට ක්‍රියාකාරී ව සහභාගි විය යුතු වෙයි.

දිව්‍ය පූජාවට ක්‍රියාකාරී ව සහභාගි වීමේ දී ඊට බාධා වන කතාබහෙන් වැළකී තමන්ගේ මුළු හදවතින් ම සහභාගිවීම අත්‍යවශ්‍ය යි. ඒ සඳහා යාච්ඤාවලට සහභාගි විය යුතු ය. ගීතිකා ගායනා කළ යුතු ය. යාච්ඤාවලට පිළිතුරු දිය යුතු ය.

රෝගී ව සිටීම, ළඟපාත ස්ථානයක දිව්‍ය පූජාවක් නොතිබීම, අත්‍යවශ්‍ය සේවාවන්හි යෙදී සිටීම ආදි විශේෂ කරුණක දී හැර වයස අවුරුදු හතට වැඩි සැම අයෙක් ම මෙම ශික්ෂාපද අනුව ක්‍රියා කළ යුතු වේ. සාධාරණ හේතුවක් මත ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වීමට නොහැකි විට සුදුසු අයුරින් යාච්ඤා මෙහෙයකට සහභාගි වීම හෝ පෞද්ගලික ව යාච්ඤාවේ යෙදෙන්නට හෝ උත්සාහ කළ යුතු ය.

ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වීම සභාවේ නියමයක් ලෙස නොව දෙවි පියාණන් වහන්සේට තමන් දක්වන ගෞරවය හා භක්තිය ද කරණ කොට ගෙන කළ යුතු ය.

## 2. වසරකට වරක්වත් පාපෝච්චාරණය කිරීම

අප ජීවත්වන සමාජයේ දී බොහෝ පාපයන් අප අතින් සිදු වෙයි. සමහර විට අප දැනුවත් ව පාපි ක්‍රියාවන්ට පෙළඹෙයි. එසේ ම අප නොදැනුවත් ව සිදු වන පාපයන් ද තිබිය හැකි ය. අපගේ අතින් සිදුවන වැරදි, අඩුපාඩු හා පාපයන් නිසා අපේ ම සහෝදර සහෝදරියන් අසල්වැසියන් හා අප ඇසුරු කරන අය අතර සුහදතාව පළුදු විය හැකි ය. අප අතර තිබිය යුතු සහෝදර සබඳතාව නැති වී යා හැකි ය. තමන් අතින් මරණීය පාපයක් එනම් බරපතළ වරදක් සිදු වූ විට එම පාපයට පාපෝච්චාරණය තුළින් සමාව ලබා ගත යුතු අතර එවිට වසරකට එක් වරකට වඩා පාපෝච්චාරණය කිරීමට සිදු වේ.

මරණීය පාපයක් නැතත් අවම වශයෙන් වසරකට වරක්වත් අප විසින් පාපෝච්චාරණයක් කරගැනීම අවශ්‍යය ය.

## 3. පාස්කු සමය තුළ දිව්‍ය සත්ප්‍රසාද ලැබීම

පුරාණ කාලයේ මිනිසුන් තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට තිබූ බිය නිසා මෙම ශික්ෂාපදය තිබුණත් අද අපට ශුද්ධ වූ සභා මාතාව උගන්වන්නේ සැම දිව්‍ය යාගයක දී ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ය. එසේ ම අප සහභාගි වන දිව්‍ය පූජා යාගය සම්පූර්ණ වීමට නම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබිය යුතු ය.

## 4. නියම වූ දිනයන්හි ගොඩමස් වැළකීම සහ එක්වරු ශීලය රැකීම

### ★ ගොඩමස් වැළකීම

ගොඩමස් වැළකීම යන්නෙන් අදහස් කරන්නේ නියමකොට ඇති දිනයන්හි දී ගොඩබිම ජීවත් වන සතුන්ගේ මස් අනුභවයෙන් වැළකී සිටීම ය. එම දින වන්නේ;

- අළු බදාදා
- මහ සිකුරාදා සහ
- අවුරුද්දේ සෑම සිකුරාදා ම ය.

### ★ එක්වරු ශීලය

එක්වරු ශීලය යනු දිනකට එක් සම්පූර්ණ ආහාර වේලක් පමණක් අනුභව කොට, ඉතිරි දෙවේල ආහාර නොගෙන සිටීම හෝ සුළු ආහාරයක් ගැනීමයි. එක්වරු ශීලයේ පරමාර්ථ වන්නේ;

- තමන්ගේ පාපවලට වන්දි ගෙවීම
- ආත්ම දමනය පුහුණු කිරීම
- නිරාහාරව දින හතළිහක් උපවාස කළ ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කිරීම.

එක්වරු ශීලයේ දී තමන් නොගෙන ඉතිරි කරන ආහාර වේල නැති බැරි කුසගින්නේ සිටින අයකුට දන්දෙන ලෙස ශු. සභා මාතාව අපට උගන්වන්නී ය. එබැවින් දන්දීම එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථයකි.

වයස අවුරුදු 18-60 අතර අයට මෙම ශික්ෂාපදය බලපැවැත්වෙන අතර රෝගී හා වයස්ගත වූවන් මෙයින් නිදහස් කරනු ලැබේ. එහෙත් අන් අයට ද ස්වෙච්ඡාවෙන් එක්වරු ශීලය රැකිය හැකි ය.

අළු බදාදා හා මහ සිකුරාදා දින එක්වරු ශීලය රැකීමට නියම වන නමුත් වෙනත් දිනවල ද ස්වේච්ඡාවෙන් එක්වරු ශීලය රැකීමට පුළුවන.

## 5. සභාවේ නඩත්තුව සඳහා ආධාර කිරීම

ඕනෑ ම ආයතනයක හෝ සංවිධානයක පැවැත්ම සඳහා එහි සාමාජිකයන් තමන්ට හැකි ආකාරයෙන් පරිත්‍යාග කිරීම සාමාන්‍ය සිරිතකි. එලෙස ම ශුද්ධ වූ සභාවේ පැවැත්ම සඳහා එහි සාමාජිකයන් තමන්ට හැකි ආකාරයට පරිත්‍යාග කිරීමට මෙම ශික්ෂාපදයෙන් නියම කෙරේ. දේවස්ථාන නඩත්තුව, සභා ශ්‍රේෂ්ඨයන්ගේ නඩත්තුව හා මීසම් තුළ පවත්නා විවිධ දයා සේවා කටයුතු සඳහා මෙම පරිත්‍යාග යොදවයි.

**ක්‍රියාකාරකම**

1. ශුද්ධ වූ සභාවේ ශික්ෂාපද **පහ** නම් කරන්න.
2. දිව්‍ය පූජාවට ක්‍රියාශීලී ව සහභාගිවීම සඳහා ඔබට කළ හැකි කාර්ය **තුනක්** ලියන්න.
3. ගොඩමස් වැළකීම හා එක්වරු ශීලය රැකීමට නියම වී තිබෙන දවස් වෙන වෙන ම ලියන්න.
4. එක්වරු ශීලය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?



**ජීවිතයට බිඳක්**

★ ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් මුළු පූජාවට සහභාගි වෙමු

★ අවම වශයෙන් වසරකට වරක්වත් පාපෝච්චාරණය කරමු

★ නියමිත දිනයන්හි දී එක්වරු ශීලය රකිමු